සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 88 | S | I |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### ශිල්ප කලා - I

**නම/විභාග අංකය : .....................................** **කාලය : පැය 01 යි.**

වැදගත් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✕) ලකුණ යොදන්න.

(01) දුම්බර පැදුරු විවීම සඳහා කෙඳි ලබා ගන්නා ශාකය කුමක් ද?
(1) නියඳ (2) ජූට් (3) හණ (4) මැනිලා

(02) ලාක්ෂා මඟින් දැව භාණ්ඩ අලංකාර කරගන්නා නිවැරදි ක්‍රමය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දැව භාණ්ඩ මත ලාක්ෂා පින්සලක් මඟින් ආලේප කිරීම.
(2) ඉසින යන්ත්‍රයකට ලාක්ෂා දමා දැව භාණ්ඩ මතට ඉසීම.
(3) දැව භාණ්ඩ මත ලාක්ෂා කෙඳි දවටා රත්කර වියළි තල කොළයකින් පිරිමැද ඒ මත නියපොතු ආධාරයෙන් රටා ඇඳීම.
(4) පන්වි කැබැල්ලක් මඟින් ලාක්ෂා ආලේප කිරීම.




(03) රූපයේ දැක්වෙන ඉලිප්සය නිර්මාණය කිරීමට යොදාගෙන ඇති ක්‍රමවේදය කුමක් ද?
(1) චාප ක්‍රමය
(2) සැකිලි ක්‍රමය
(3) ඒකකේන්ද්‍රික ක්‍රමය
(4) සෘජුකෝණාස්‍ර ක්‍රමය

(04) සිලින්ඩරයක විකසනය ඇඳීමේ දී වෘත්තයක පරිධියේ දිග සොයා ගැනීමට භාවිත කළ හැකි සූත්‍රය කුමක් ද?
(1) $\pi r^2$ (2) $2\pi r$ (3) $5\pi r$ (4) $\pi^2 r$

(05) ඉලිප්සයක නාභිය සොයාගන්නා ආකාරය වන්නේ,
(1) ඉලිප්සයේ කේන්ද්‍රයේ සිට මහා අක්ෂය දෙසට ඡේදනය කිරීම.
(2) මහා අක්ෂයේ කෙළවර සිට මහා අක්ෂය දෙසට ඡේදනය කිරීම.
(3) මහා අක්ෂයේ අඩක දුරක් කවකටුවට ගෙන සුළු අක්ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍ර කර මහා අක්ෂය දෙපසට ඡේදනය කිරීම.
(4) මහා අක්ෂයේ සම්පූර්ණ දුර, කවකටුවට ගෙන සුළු අක්ෂයේ කෙළවරක සිට මහා අක්ෂය දෙපසට ඡේදනය කිරීම.

(06) පහත රූප සටහනේ සැඟි දාර දැක්වීමට හා සමමිතික බව දැක්වීමට යොදාගෙන ඇති රේඛා වර්ගය වන්නේ,
(1) කඩ රේඛා, සිහින් දාම රේඛා
(2) සිහින් අඛණ්ඩ රේඛා, ඝන අඛණ්ඩ රේඛා
(3) ඝන අඛණ්ඩ රේඛා, කඩ රේඛා
(4) ඝන දාම රේඛා, සිහින් දාම රේඛා





NWP EXAM

(07) වෘත්තයක චාපයකින් හා ජ්‍යායකින් අන්තර්ගත වූ කොටස ඇතුළත් රූප සටහන තෝරන්න.

(1) (2) (3) (4)



(08) රූප සටහනේ ABC කෝණ හඳුන්වන නම් ඇතුළත් පිළිතුර තෝරන්න.




(1) A - සුළු කෝණය B - සෘජු කෝණය C - සරල කෝණය
(2) A - සුළු කෝණය B - මහා කෝණය C - පරාවර්ථ කෝණය
(3) A - සරල කෝණය B - සෘජු කෝණය C - මහා කෝණය
(4) A - පරාවර්ථ කෝණය B - සුළු කෝණය C - සරල කෝණය

(09) සමපාද ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණයක අගය කීය ද?
(1) $60^0$ (2) $180^0$ (3) $90^0$ (4) $120^0$

(10) පහත සඳහන් චතුරස්‍ර අතුරින් ඇල සමාන්තරාස්‍ර ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සමචතුරස්‍රය, රොම්බසය (2) රොම්බසය, රොම්භාබය
(3) සමචතුරස්‍රය, සෘජුකෝණාස්‍රය (4) සෘජුකෝණාස්‍රය, රොම්බසය

(11) පසු පිරියම්කරණය සඳහා මහා පරිමාණ කර්මාන්තවල යොදා ගන්නේ,
(1) අව්වේ වියළා ගැනීම. (2) සේදීම
(3) තද උෂ්ණත්වයෙන් මැදීම. (4) කැඳ ඉවත් කිරීම.

(12) මිනිසා විසින් නිපදවනු ලබන කෘත්‍රිම කෙඳි වර්ගය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නියඳ (2) සේද (3) විස්කෝස් (4) ඇස්බැස්ටෝස්

(13) අතීතයේ දී මිනිසා නූල් කැටීම සඳහා භාවිත කළ උපකරණය කුමක් ද?
(1) තක්ලිය (2) එතුම් රෝදය (3) දුවන නඩාව (4) ජෙනී යන්ත්‍රය

(14) හණ කෙඳිවලින් වියනු ලබන රෙදි වර්ගය වන්නේ,
(1) සේද (2) ලෝම (3) ලිනන් (4) පොලියෙස්ටර්

(15) පෙනා (අන්නාසි කෙඳි) භාවිත කර රෙදි වියනු ලබන රට කුමක් ද?
(1) ඇමරිකාව (2) චීනය (3) ජපානය (4) පිලිපීන දූපත්

(16) ඇංගෝර එළුවාගෙන් ලබාගන්නා ලෝම හඳුන්වන නම කුමක් ද?
(1) මෝහෙයාර් (2) ලිනන් (3) සේද (4) රෙයෝන්

(17) කාර්මික කටයුතු සඳහා භාවිත කරන රෙදි පිළි ඇස්බැස්ටෝස් වැනි ඛනිජ කෙඳිවලින් නිපදවීමට හේතුව වන්නේ,
(1) ඇඳීමට පහසු නිසා (2) තද සීතලට ඔරොත්තු දෙන නිසා
(3) ගිනි නොගැනීම නිසා (4) සිනිඳු නිසා

(18) රෙදි පිළිස්සීමේ දී පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන රෙදි වර්ග මොනවා ද?
(1) ලෝම, සේද (2) ලිනන්, කපු
(3) ඛනිජ කෙඳි, කපු (4) ලිනන්, ලෝම

(19) දික් හරස් නූල් එකක් හැර එකක් ළං ව බැඳෙන වියමන කුමක් ද?
(1) ජටා වියමන (2) දික්දාර වියමන
(3) හරස්දාර වියමන (4) චාම් වියමන

NWPEXAM

(20) සේද රාමු මුද්‍රණයේ දී තිරය මතට මෝස්තරය ලබා ගැනීමේ දී භාවිත කරන ආලෝක සංවේදී ක්‍රමයේ දී භාවිත කරන රසායනික ද්‍රව්‍ය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ක්ලැටැක්, ජෙලටින්, ඩයික්‍රොමේට් (2) හයිඩ්‍රොසල්ෆයිඩ්, ජෙලටින්, ක්ලැටැක්

(3) කොපර්, ජෙලටින්, ලුණු (4) පිග්මන්ට්, ජෙලටින්, ටීපෝල්

(21) මානව ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමඟ පැවත එන කාලාවක් ලෙස දීර්ඝ ඉතිහාසයක් ඇත. එම කර්මාන්තය වන්නේ,

(1) පේෂ කර්මාන්තය (2) මැටි කර්මාන්තය

(3) පිත්තල කර්මාන්තය (4) වෙස්මුහුණු කර්මාන්තය

(22) මාතෘ පාෂාණය දිරාපත් වීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ,

(1) සිලිකා (2) ඩොලමයිට් (3) පෙලිස්ටාර් (4) ග්‍රොග්

(23) නිර්මාණ ක්‍රියාවලිය අනුව ජීර්ණය වූ ස්ථානයේ ම තැන්පත් වන මැටි හඳුන්වන නාමය කුමක් ද?

(1) ද්විතියික මැටි (2) අගම්මැටි (3) බෝලමැටි (4) ප්‍රාථමික මැටි

(24) "කෙඔලනයිට් මැටි" එහි අඩංගු යකඩ ප්‍රතිශතය අනුව කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක මොනවා ද?

(1) කෙඔලින් මැටි, බෝල මැටි (2) මකුළු මැටි, රතු මැටි

(3) කළු මැටි, තලප මැටි (4) ගිනි මැටි, බෝල මැටි

(25) මැටි ජලය සමඟ එක්වීමේ දී ඇතිවන ඇලෙන සුළු බව හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) සවිවරතාව නමිනි. (2) සුවිකාර්යතාව නමිනි.

(3) හැකිළීම නමිනි. (4) වර්ණය නමිනි.

(26) ශ්‍රී ලංකාවේ හොඳම කෙඔලින් මැටි නිධිය පිහිටා ඇත්තේ ගාල්ල දිස්ත්‍රික්කයේ කිනම් ප්‍රදේශයක ද?

(1) දෙවුන්දර (2) බොරලැස්ගමුව

(3) මීටියාගොඩ (4) අම්බලන්ගොඩ

(27) කළුතර දිස්ත්‍රික්කයේ දෙදියවල පිහිටා ඇති මැටි නිධිය හඳුන්වන්නේ,

(1) තලප මැටි (2) ගිනි මැටි

(3) මකුළු මැටි (4) බෝල මැටි

(28) මූර්තියක් නිර්මාණය කිරීමේ දී වැදගත් අංගයක් ලෙස හැඳින්වෙන්නේ,

(1) සමබරතාව සහසංරචකය යි. (2) සමබරතාව සහ අවකාශය යි.

(3) රිද්මය සහ වයනය යි. (4) අවකාශය සහ සංරචකය යි.

(29) පැච්වර්ක් නිර්මාණයක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් සඳහන් නිවැරැදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A - විවිධ වර්ණ සංකලනයන් සඳහා අවශ්‍ය රෙදි තෝරා ගැනීම.

B - ගැළපෙන හැඩතලවලට ආකර්ෂණ ආකාරයට වර්ණ ගලපා රෙදි කැබලි නිවැරැදිව මූට්ටු කිරීම.

C - නිවැරැදි මැහුම් ක්‍රම යොදා හොඳ නිමාවක් ලබා ගැනීම.

D - රෙදි කැබලි අපතේ යෑම වළක්වා ගැනීමට පතරොම් සකස් කර ගැනීම.

(1) A D B C (2) A B C D (3) C D A B (4) A B D C

(30) පහත දැක්වෙන මැහුම් ක්‍රම අතරින් 'බ්ලැන්කට් මැස්ම' දැක්වෙන රූප සටහන තෝරන්න.

(1)



(2)



(3)



(4)



NWP EXAM

(31) රිබන් එම්බ්‍රොයිඩර් මැසීමේ දී වමේ සිට දකුණට මැසිය යුතු මැහුම් ක්‍රමය කුමක් ද?
(1) රිබන් මැස්ම ය. (2) නැටි මැස්ම ය.
(3) ප්‍රංශ ගැට ය. (4) ලූප් මැස්ම ය.

(32) "මුහුදු පුත්තු" නාට්‍යයේ එන 'වෙරළෙන් කිරි කවඩි සොයා කෙනෙක් පුතුට ගෙන යනවා..." යන ගීතයෙන් කියවෙන විසිතුරු නිර්මාණ කලාව වන්නේ,
(1) මැහුම් නිර්මාණය (2) රිබන් නිර්මාණය
(3) කඩදාසි නිර්මාණය (4) පබළු නිර්මාණය

(33) විසිතුරු අත්කම් නිර්මාණ කලාවේ යෙදෙන අප තුළ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) මනා ඉවසීම යි. (2) කරුණාවයි.
(3) වර්ණ සංකලන හැකියාවයි. (4) නිර්මාණ කුසලතාවය යි.

(34) බීරළු රේන්ද, කැටින් රේන්ද, හර්නල් කටු රේන්ද, වූල් ඇඳුම් ආදිය නූල් හෝ වූල් භාවිත කර නිපදවයි. මේවාට පොදුවේ යෙදිය හැකි නාමය වන්නේ,
(1) විවිධ නූල් වර්ග යි. (2) විවිධ රිබන් වර්ග යි.
(3) විවිධ ගෙතුම් වර්ග යි. (4) විවිධ පබළු වර්ග යි.

(35) "තොන්ඩුව" භාවිත කර නිර්මාණ කාර්යයේ යෙදෙන ගෘහ කර්මාන්තයක් වන්නේ,
(1) ආභරණ සැකසීම යි. (2) ගෙතුම් කලාව යි.
(3) කඩදාසි නිර්මාණ සැකසීම යි. (4) මැහුම් කලාව යි.

(36) කුඩා දරුවන් සඳහා භාවිත කරන සෙල්ලම් සතෙකු නිර්මාණ කිරීමට අවශ්‍ය රෙදි කොටස් කපා ගන්නා ආකාරය පහත දැක්වේ.
- කඳ කොටස් 02යි. (කළු/ නිල්)
- හොට කොටස් 02යි. (කළු/ නිල්)
- බඩ යට කොටස යි (සුදු)
- තටු කොටස් 04යි. (කළු/ සුදු)

ඒ අනුව මැසීමට සූදානම් වන සුරතල් සත්ත්වයා වන්නේ,
(1) බලු පැටියා ය. (2) පෙන්ගුයින් ය.
(3) රෙදි බෝනික්කා ය. (4) ගිරා පැටියා ය.

(37) කඩදාසි පටි කපා ගැනීමට භාවිත කරන කඩදාසි වීරූපන යන්ත්‍ර භාවිත කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජනවත් වාසියකි.
(1) කඩදාසි රෝල් කිරීමට හැකි ය. (2) විවිධ පළලින් යුත් පටි කපා ගත හැකි ය.
(3) විවිධ හැඩැති පබළු සැකසිය හැකි ය. (4) කාලය හා ශ්‍රමය පිරිමසාගත හැකි ය.

(38) වර්තමානයේ වැඩි වශයෙන් ආරාධනා පත්‍ර හා සුබ පැතුම්පත් නිර්මාණය සඳහා භාවිත කරන මාධ්‍යයකි.
(1) පබළු ය. (2) මැටි ය. (3) රෙදි ය. (4) කඩදාසි ය.

(39) උද්‍යාන අලංකරණ කෘති නිර්මාණයේ දී අනුගමනය කළ යුතු ක්‍රම දෙක වන්නේ,
(1) ඉදිකිරීම, මූර්ති නමිනි. (2) මූර්ති, කැටයම් නමිනි
(3) අවකාශය, අනුපාතය නමිනි (4) සමබරතාව, අනුපාතය නමිනි.

(40) තහඩු භාවිතයෙන් කැටයමක් නිර්මාණය කිරීමේ දී මැටි තහඩුවේ ගැඹුරටම හාරා මතු කර ගන්නා කැටයම හඳුන්වන්නේ,
(1) අල්ප උන්නත කැටයම් නමිනි. (2) අර්ධ උන්නත් කැටයම් නමිනි.
(3) අධි උන්නත කැටයම් නමිනි. (4) මැටි තහඩුවේ කැටයම නමිනි.



IWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

### ශිල්ප කලා - II

**නම/විභාග අංකය :** ......................................      **කාලය : පැය 02 යි.**

වැදගත් :

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(01) "විසිතුරු ලොවින් නිමැයුම් බිඳක්" යන තේමාව යටතේ රාජපුර මධ්‍ය මහා විද්‍යාලයේ වර්ෂ අවසාන ශිල්ප කලා අත්කම් ප්‍රදර්ශනයක් පැවැත්විය. ඒ සඳහා ඔබ ද සම්බන්ධ වූයේ යැයි සිතා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) විසිතුරු අත්කම් භාණ්ඩ සැකසීම සඳහා භාවිත කළ හැකි දේශීය ශාක වර්ග 04ක් නම් කරන්න.

(2) අපතේ යන ද්‍රව්‍ය භාවිතයෙන් කළ හැකි විසිතුරු නිමැයුම් 04ක් නම් කරන්න.

(3) ප්‍රදර්ශනය පැවැත්වෙන ස්ථානය අලංකාර කිරීමට සුදුසු මල් වර්ග 04ක් නම් කරන්න.

(4) විසිතුරු නිමැයුම් කළ හැකි ජන කලා කර්මාන්ත 02ක් නම් කරන්න.

(5) ප්‍රදර්ශනයේ විවිධ හැඩයේ පැච්වර්ක් නිර්මාණ ද දකින්න ලැබුණි. පැච්වර්ක් නිර්මාණ සඳහා සුදුසු හැඩතල 02ක් අඳින්න.

(6) මැටි භාවිතයෙන් කළ හැකි නිර්මාණ 04ක් නම් කරන්න.

(7) ස්වභාවික කෙඳි භාවිතයෙන් කර තිබූ නිපැයුම් 04ක් නම් කරන්න.

(8) කඩදාසි භාවිතයෙන් කළ හැකි නිර්මාණ 02ක් නම් කර රූප සටහන් අඳින්න.

(9) රෙදි පින්තාරු කලාව භාවිතයෙන් විසිරු නිර්මාණ රාශියකි. සුදුසු මෝස්තර 02ක් අඳින්න.

(10) ප්‍රදර්ශන භාණ්ඩ සැකසූ සියලුම සිසුන්ට ත්‍යාග ලබා දීමට විෂයභාර ගුරුතුමිය කටයුතු කර තිබුනි. ත්‍යාගය අසුරා තිබූ ඇසුරුම් පෙට්ටියක ආකෘතියක් අඳින්න.

(ලකුණු 2 x 10 = 20)

(02) ජ්‍යාමිතික නිර්මාණ සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිත කරයි.

(1) රේඛා නිර්මාණය කිරීමට භාවිත කරන උපකරණ 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) අරය 35mm ක් වූ වෘත්තයක් තුළ සවිධි ෂඩාශ්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(3) පහත දැක්වෙන්නේ චොක්ලට් ඇසුරුමකි. එහි විකසනය අඳින්න.



(ලකුණු 04)

(03) රෙදිපිළි අලංකරණය සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිත කර ගෘහස්ථ කර්මාන්තයක් ලෙස ද අච්චු මුද්‍රණ ක්‍රියාවලිය යොදා ගත හැකි ය.

(1) අච්චු ප්‍රධාන කොටස් කීය ද? ඒ මොනවා ද? (ලකුණු 02)

(2) අච්චු තැනීම සඳහා භාවිත කරන ලී වර්ග 04ක් නම් කර එම දැවවල තිබිය යුතු ගුණාංග 02ක් ලියන්න. (ලකුණු 04)

(3) තාප බන්ධිත ක්‍රමයෙන් ළදරු ඇඳුමක් අලංකාර කරගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 04)

(04) රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේ දී කෙඳි ලෙස හඳුන්වනු ලබන්නේ කිසියම් දිගකින් යුත් රේඛීය දාමයක ආකාරයට පිළියෙළ වීමකින් ගොඩනැගුණු ව්‍යුහයකි.

(1) කෙඳි ලබාගන්නා ප්‍රධාන ක්‍රම කීය ද? නම් කරන්න. (ලකුණු 02)

(2) කෙඳි හඳුනාගැනීමේ සරල පරීක්ෂණ 04ක් ලියන්න. (ලකුණු 04)

(3) ප්‍රධාන වියමන් රටා නම් කර ඔබ කැමති වියමන් රටාවක් ඇඳ නම් කරන්න. (ලකුණු 04)

(05) ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල විවිධ මැටි වර්ග ඇත.

(1) මැටි වර්ග කිරීමේ ක්‍රම තුන ලියන්න. (ලකුණු 02)

(2) ප්‍රාථමික මැටි වර්ග හා ද්විතියික මැටි වර්ග ලියන්න. (ලකුණු 04)

(3) මැටි දරුණු භාවිතයෙන් මල් පෝච්චියක් සාදා ගන්නා ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

(06) කාලීන අවශ්‍යතාවන්ට සරිලන නිර්මාණ විසිතුරු අලංකරණ නිර්මාණවලින් කළ හැකි ය.

(1) පැච්වර්ක් නිර්මාණ ලෙස හඳුන්වන්නේ මොනවා ද? (ලකුණු 02)

(2) පබළු භාවිතයෙන් කළ හැකි ආභරණ 04ක රූප සටහන් අඳින්න. (ලකුණු 04)

(3) අත් පසුම්බියකට සුදුසු හැඩතලයක් ඇඳ එය අලංකාර කිරීමට සුදුසු විසිතුරු මැහුම් ක්‍රම 02ක් නම් කරන්න. (ලකුණු 04)

(07) වර්තමානයේ උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා විශේෂ ඉල්ලුමක් පවතියි.

(1) අතීතයේ උද්‍යාන අලංකරණ තිබූ බවට උදාහරණ සපයන ස්ථාන 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) එදා හෙළයා විසින් උද්‍යාන අලංකරණ සඳහා භාවිත කළ මාධ්‍ය 04ක් නම් කරන්න. (ලකුණු 04)

(3) ඔබ කැමති බිතු කැටයමකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

NWP EXAM